

# කඨින චීවර පූජාව

පූජ්‍ය පන්නල සුමන හිමි

ප්‍රකාශනය - ලීඩ්ස් බෞද්ධ විහාරය

## අනුජානාමි භික්ඛවෙ වස්සානෙ වස්සං උපගන්තුං.
## "මහණෙනි" වස්සාන කාලයේ වස් එළඹෙන්නට අනුදනිමි.

බෞද්ධයන් ලෙස අප මේ වර්ෂයේ ගත කරන මෙම කාල වකවානුව ඉතා වැදගත් කාල පරිච්ඡේදයකි. මක්නිසා ද යත් චීවර මාසය නැතහොත් කඨින මාසය ලෙස හඳුන්වන්නේ මේ කාලය යි. මෙහි වැදගත් කාරණය වන්නේ ගිහි පැවිදි යන දෙපාර්ශවයට ම පිංකම් සිදු කරගැනීමට හැකිවීම යි. ඒ බව ත්‍රිපිටකයේ විනය පිටකයට අයත් මහාවග්ග පාලියේ දී වස් විසීම හා පවාරණය, චීවර පූජාව ආදිය පිළිබඳව විස්තර කොට ඇත.

බුද්ධ දේශනාවේ විශේෂ වශයෙන් ආනිසංස ලැබීමේ පිංකම් අටක් විස්තර කොට ඇත. එම පිංකම් වලට වෙන් වෙන් වූ ආනිසංසයන් ද දේශනා කොට ඇත.

01 කඨින චීවර පූජාව
02 අට පිරිකර පූජාව
03 සංඝාවාස පූජාව
04 මහා සංඝරත්නයට දන් පූජා කිරීම
05 දහම් පොත් ලිවීම සහ පූජා කිරීම
06 සඝසතු කොට කෙත්වතු පූජා කිරීම
07 බුද්ධ ප්‍රතිමා තැන වීම
08 වැසිකිලි සාදා පූජා කිරීම



මේ අතරින් කඨින පිංකමට ද විශේෂ වූ ආනිසංස විස්තර කර ඇත. අනෙක් පිංකම් අතරින් කඨින පිංකම වැදගත් වීමට හේතු කාරණා රාශියක් ඇත.



බුද්ධ කාලයේ දී භික්ෂූන් වහන්සේලාගේ ඒකායන අරමුණ වූයේ සත්ත්වයා සසර දුකින් එතෙර කරවීම යි. වස්සාන කාලයේ ද බුද්ධ ශ්‍රාවකයන් වහන්සේලා තම කායඝ්‍ මැනවින් ඉටුකරමින් සිටි අතර නිගන්ඨ ආදී අන්‍ය තීර්ථකයන් විසින් බුදුරාජාණන් වහන්සේගේ ශ්‍රාවකයන් වැසිකාලයේ දී ගමන් බිමන් යමින් කෘමීන් මෙන්ම නැවුම් තණ කොළ පාගමින් ධර්ම චාරිකාවේ හැසිරෙන බවට චෝදනා නගන ලදී. එම කාරණය ද ත්‍රිපිටකයේ මහා වග්ගපාලියේ වස්සූපනායිකඛන්ධකයේ වැඩි දුරටත් විස්තර කොට ඇත.


© ලීඩ්ස් බෞද්ධ විහාරය

මෙලෙස අන්‍ය තීර්ථකයන් විසින් චෝදනා එල්ල කිරීමත් සමඟ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට අනුදැන වාදාරන්නේ

**"අනුජානාමි භික්ඛවෙ වස්සානෙ වස්සං උපගන්තුං"**
**"මහණෙනි" වස්සාන කාලයේ වස් එළඹීමට අනුදනිමි.**

එම බුද්ධ නියමය අනුව ඇසල මස පුර පසලොස්වක පොහොය දිනයේ දී වස් සමාදන් වී වස් තුන් මාසය ගත කොට වප් පුර පසලොස්වක පොහොය දිනයේ මහා පවාරණයෙන් වස් පවාරණය කරණ ලද භික්ෂුවක් කඨින චීවරය පිළිගැනීමට සුදුසු වේ. ඇසල පොහොය දිනයේ වස් සමාදන් නොවූ හාමුදුරුවන් කෙනෙකුට නිකිනි පුර පසලොස්වක පොහෝය දවසේ පසු වස් සමාදන් වීමට හැකි වූ නමුත් එම හාමුදුරුවන් වහන්සේට කඨින චීවරයක් පිළිගැනීමට හැකියාවක් නොමැත.

මෙම බුද්ධ නියමය ඉටු කිරීමක් ලෙස උපසම්පදා භික්ෂූන් වහන්සේලා වස් තුන් මාසය තුළ එක් ස්ථානයක් තෝරාගනිමින් කාලය ගතකරන අතර එම කාලවකවානුවේ යම් අවශ්‍යතාවයක් වෙනුවෙන් බැහැරට වැඩම කොට නැවත දින හතක් ඉක්ම වීමට මත්තෙන් වස් විසූ ස්ථානයට වැඩම කිරීමට බුදුරජාණන් වහන්සේ අවසර දී ඇත. එය දේශනාවේ හඳුන්වා ඇත්තේ සතිකරණය ලෙසයි.



කඨින පිංකමකදී භික්ෂූන් වහන්සේලාට සිවුරු රෙදි වශයෙන් ද චීවරයක් හැටියට සකසා කඨිනය වර්තමානයේ පූජා කරයි. අතීතයෙත් පාංශුකුල රෙදි පඬුගසා චීවරයක් ලෙස පූජා කොට ඇත. මහා සංඝරත්නයට මෙම සිවුර පූජා කිරීමෙන් අනතුරුව මහා සංඝරත්නයේ ඒකමතික තීරණය අනුව වාක්‍යයකින් පවරා සිවුර වස් විසූ එක් හාමුදුරුවන් කෙනෙකුට පූජා කරයි. එලෙස පූජා කරන චීවරය සැකසී ඇති ආකාරය පිළිබඳව ද දේශනාව තුළ නොයෙක් අදහස් දක්වා ඇත. ඒ අතර ආනන්ද හාමුදුරුවන් සමඟ බුදුරජාණන් වහන්සේ මගධ රටේ වඩින අතර මගදී කුඹුරු යායක් අසලින් වඩින විට මෙම කුඹුරු යායේ නියර හා ලියැදි අනුව චීවරය සකස් කොට ගත යුතු යැයි දේශනා කරන ලද බව මහා වග්ගපාලියේ චීවරඛන්ධකයේ සඳහන් කොට ඇත.

වර්තමානයේ දී දායකයන් විසින් නොයෙක් අකාරයේ පෙරහැර ආදී අංග උපාංගයන්ගෙන් යුක්තව කඨින පිංකම සිදු කරයි. මේ ආදී වශයෙන් සිදුකරණ මේ පිංකමේ අනිසංසයන් පිළිබඳව දීර්ඝ ලෙස විස්තර කොට ඇත.



කඨිනයේ ආනිසංසයන් බලවත් වීම හේතුකොටගෙන දායකයන් තුළ දැඩි අවධානයක් හා උද්යෝගයක් මේ පිංකම කෙරෙහි යොමු වී ඇත. එමෙන් ම එක් වසරක දී වස්සාන කාලයේ පමණක් එක් විහාරස්ථානක එක් වරක් පමණක් සිදු කළ හැකි පිංකමක් නිසාත්, පාංචානන්තරිය පාප කර්මයන් හැර ඉන් මෙහා ඇති අකුසල කර්මයන් විපාක නොදීමට හේතුවන අතර මේ මාහැඟි පුණ්‍ය කර්මය හේතුකොට ගෙන ගිහි පැවිදි යන දෙපාර්ශවයට ම මහත් වූ ආනිසංසයන් ලැබෙන පිංකමකි.

කඨිනයේ ආනිසංසයන් පිළිබඳව අවධානය යොමු කිරීමේ දී නාගිත හාමුදුරුවන් වහන්සේ බුදුරජාණන් වහන්සේ ඉදිරියේ කළ දේශනයේ එම ආනිසංසයන් මෙලෙස දක්වා ඇත.


© ලීඩ්ස් බෞද්ධ විහාරය

**කඨින දානං දත්වාන**
**සංඝෙ ගුණ වරුත්තමෙ**
**ඉතෝ තිංසෙ මහා කප්පෙ**
**නාභිජානාමි දුග්ගතිං**

උතුම් ගුණ ඇති මහා සංඝරත්නය කෙරෙහි කඨින දානයක් දී මහා කල්පයක දී කල්ප තිහක් දුගතියේ උත්පත්තිය නොලැබීමට එය හේතු වන මහා පිංකමකි. එසේම කල්ප දහඅටක් පුරාවට දිව්‍ය ලෝකයේ වාසය කිරිමටත් සක්දෙව් රජුව ඉපදීමටත් එක් ඉදිකටු පහරක් පසා සක්විති රජ වීමටත් චක්‍රවර්ති රාජ්‍ය සම්පත් ලැබීමටත් උසස් කුලයන්හි උත්පත්තිය ලැබීමටත් දුගතියේ නො ඉපදීමටත් මෙන්ම මෙලොව පරලොව දෙලෝකයේම සැප සම්පත්තීන් ලැබීමටත් හේතු වන මහගු පිංකමක් ලෙස ශාසන ඉතිහාසයේ මේ පිළිබඳව විස්තර කොට ඇත.

කඨිනය යන වචනයේ අදහසෙන් ද මේ පිංකමේ ඇති බලසම්පන්න භවය කියවේ. එහි අදහස නම් බිඳිය නොහැකි, තද, ඝන, ශක්තිමත් හා ස්ථාවර යන්නයි.

**පඨවිරිව න ජාතු කම්පතෙ**
**න චලති මේරුරිවාති වායුනා**
**වජිරමිව න භිජ්ජතෙ ඝනං**
**තමිද මතො කඨිනන්ති වුච්චති**

කඨිනය පූජා කිරීමෙන් ලැබෙන පින හේතු කොටගෙන මහා පොළොව මෙන් කම්පා නොවන අතර එලෙස කම්පා කරවීමටත් නොහැක. මහා මේරු පර්වතය මෙන් සුළඟින් සෙලවීමටත් නොහැකි බවත් දියමන්ති පර්වතයක් බිඳින්නට නොහැකිවන්නා සේ පිං ලැබිය හැකි ස්ථාවර ශක්තිමත් බලසම්පන්න කටයුත්තකි.

මේ අනුව විමසා බැලීමේ දී කඨිනය යනු මහත් වූ ආනිසංස ලැබෙන මෙලොව පරලොව දෙලෝකයේම යහපත ඇති කරගත හැකි උතුම් පිංකමකි. ශ්‍රද්ධාව පෙරටු කොට ගනිමින් මෙම පිංකම්වලට දායක වී නිවන් සාක්ෂාත් කරගන්නට හැකි බවත් සිහිපත් කරමි.

තෙරුවන් සරණයි.


© ලීඩ්ස් බෞද්ධ විහාරය